**ප්‍රධාන කරුණු ලේඛනය (KFD)**
**රන් ණය**
**ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව සහ ෆිනෑන්ස් පීඑල්සී**

| නිෂ්පාදනය | මූලික විශේෂතා සහ ප්‍රතිලාභ | පොලී අනුපාත සහ අනෙකුත් අය කිරීම් | අනුගමනය කළ යුතු ක්‍රියාපිළිවෙළ | ප්‍රධාන නියම සහ කොන්දේසි | නිෂ්පාදනය/සේවාව සම්බන්ධ අදාළ නෛතික විධිවිධාන | පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටිය |
|---|---|---|---|---|---|---|
| රන් ණය | අ) 18K-24K රන් පවුමක් (8g) සඳහා උපරිම ණය මුදලක්<br>ආ) තරඟකාරී අඩු පොලී අනුපාත.<br>ඇ) MBSL ශාඛා ඕනෑම එකක් හරහා ගෙවීම් සිදු කළ හැකිවීම.<br>ඈ) කුඩා ණය සඳහා ද ඉල්ලීම් භාරගනු ලැබීම<br>ඉ) අසමසම, වේගවත් සහ සුහදශීලී සේවාවක් ලබාදීම<br>ඊ) පෞද්ගලිකත්වය සහ රහස්‍යභාවය සුරැකීම<br>උ) කල්තියා දැනුම් දීමකින් තොරව භාණ්ඩ බේරා ගැනීමේ හැකියාව | අ) අදාළ පොලී අනුපාත දිවයින පුරා සෑම ශාඛාවකම ප්‍රදර්ශනය කර ඇත. වෙළඳපල තත්ත්වයන් අනුව අපගේ පොලී අනුපාත කාලයෙන් කාලයට සංශෝධනය කරනු ලැබේ.<br>ආ) අලුත් කිරීමේදී, අර්ධ ගෙවීමේදී, අර්ධ මුදා ගැනීමේදී සහ භාණ්ඩය මුදා ගැනීමේදී උපචිත පොලිය අය කරනු ලැබේ.<br>ඇ) ණය ලබා දුන් දිනය ඇතුළත්ව සහ බේරුම් කළ දිනය අතහැර සත්‍ය දින ගණන සඳහා පොලිය ගණනය කරනු ලැබේ.<br>ඈ) රන් ණය ගිවිසුමේ කාලය ඉකුත් වූ විට මසකට 0.5% ක දඩ මුදලක් අය කරනු ලැබේ. | අ) පාරිභෝගිකයා තම ස්වර්ණාභරණ රැගෙන ආසන්නතම ශාඛාවට පැමිණ රන් ණය නිලධාරියා සමඟ තම අවශ්‍යතාව සාකච්ඡා කිරීම.<br>ආ) රන් ණය නිලධාරියා රන් භාණ්ඩය තක්සේරු කර පාරිභෝගිකයාගේ අවශ්‍යතාව අනුව ණය මුදල ප්‍රකාශ කරනු ලැබේ.<br>ඇ) තෝරාගත් නිෂ්පාදනය සම්බන්ධ ණය මුදල සහ අනෙකුත් නියම හා කොන්දේසිවලට පාරිභෝගිකයා එකඟ වුවහොත්, සමාගම විසින් ණය මුදල ලබා දෙනු ලැබේ.<br><u>අවශ්‍ය ලේඛන</u> | <u>සුදුසුකම්</u><br>අ) රන් හෝ රන් ස්වර්ණාභරණ (කැරට් 18 සිට 24 දක්වා) සතු වයස අවුරුදු 18 ට වැඩි ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම<br>ආ) නියමිත කාල සීමාව තුළ මුදා නොගත් සෑම උකසක්ම, උකස් පනතේ විධිවිධාන අනුව පාරිභෝගිකයාට නිසි ලිඛිත දැනුම් දීමකින් පසු වෙන්දේසියෙන් විකුණනු ලැබේ.<br>ඇ) උකස් තබන ලද ඕනෑම භාණ්ඩයක් නැතිවීමේ හෝ හානි වීමේ අවස්ථාවක, සමාගම විසින් එම හානිය වූ අවස්ථාවේ පවතින රන්වල වටිනාකම මත පදනම්ව ගෙවනු ලැබේ. | උකස් පනත සහ උකස් කරුවන්ගේ ආඥාපනත | අපගේ නිෂ්පාදන හෝ සේවාවන් සම්බන්ධයෙන් පාරිභෝගිකයින්ට පැමිණිලි ඉදිරිපත් කළ හැක.<br>අ) අදාළ ශාඛා කළමනාකරු සම්බන්ධ කර ගැනීම.<br>ආ) පාරිභෝගික පැමිණිලි හැසිරවීමේ නිලධාරියා (ක්‍රියාකාරී) සම්බන්ධ කර ගැනීම.<br>පැමිණිල්ල ලැබුණු පසු, අපි එය ලැබුණු බව ද, වහාම ගත් ක්‍රියාමාර්ග පිළිබඳව පාරිභෝගිකයාට දැනුම් දෙන්නෙමු. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | ඌ) උකස් කළ භාණ්ඩ සඳහා නොමිලේ රක්‍ෂණ ආවරණය | | වලංගු හඳුනා ගැනීමේ ලේඛන (ජාතික හැඳුනුම්පත / වලංගු රිය පැදවීමේ බලපත්‍රය හෝ වලංගු ගමන් බලපත්‍රය) | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | ඉ) ඕනෑම පුද්ගලයෙකුට ගෙවීම් සිදුකිරීමේ හැකියාව<br><br>ඊ) භාණ්ඩ කිහිපයක් උකස් කර ණයක් ලබාගෙන ඇති විට, එයින් තනි භාණ්ඩයක් පමණක් වුවද බේරාගැනීමේ හැකියාව. | ඉ) වෙන්දේසියකින් ජනිත වූ පිරිවැය වෙන්දේසිය සඳහා ඉදිරිපත් කල ගිවිසුම් සඳහා වෙන වෙනම අයකරනු ලැබේ.<br><br>ඊ) වෙනත් ආයතනයක පවතින ණය භාරගැනීම (Takeover Business) සඳහා සම්පූර්ණ ණය මුදලෙන් 0.25% ක් පෙරගෙවීමක් ලෙස අය කරනු ලැබේ. | | ඇ) උකස් භාණ්ඩ වෙන්දේසි වූ අවස්ථාවක අයකරගතයුතු සම්පූර්ණ මුදල ට (උකස් අත්තිකාරම් මුදලේ පොලිය, දඩපොලිය, වෙන්දේසි ගාස්තු) වඩා වැඩි මුදලකට භාණ්ඩ විකුණා ඇත්නම් ඒ පිළිබදව ගනුදෙනුකරුට ලිඛිතව දැනුම් දීමකින් පසු අදාල අතිරික්ත විකුණුම් මුදල් නැවත ගනුදෙනුකරුට ලබා දීමට කටයුතු කරනු ලැබේ. | | |

"සැක සහිත ගනුදෙනු සහ සීමාවට වැඩි ගනුදෙනු (මිලියනයකට වැඩි) මූල්‍ය බුද්ධි ඒකකයට වාර්තා කරනු ලැබේ" "එක් එක් ගනුදෙනුකරුගේ අත්තිකාරම් පිළිබඳ විස්තර ශ්‍රී ලංකාවේ ණය තොරතුරු කාර්යාංශයට (**CRIB**) වාර්තා කරනු ලැබේ."